මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம
Department of Education,Central Province

කාර්යාලය / அலுவலகம் / Office 081 - 2224041, 081 - 2224042
විද්‍යුත් තැපැල / மின் அஞ்சல / E mail pdcentralprovince@gmail.com

ජාතික ඵලදායිතා සම්මාන 2016 /2017 අන්තර් දෙපාර්තමේන්තු කාණ්ඩය දෙවන ස්ථානය

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ / மா.க.பணிப்பாளர் 081-2225134 / Provincial Director of Education

අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ.(පාලන) / மே.மா.க.பணிப்பாளர் (நிர்வாகம்) 081 - 2224041 / Additional Provincial Director of Education.(Admin)

අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ(මුදල්) / மே.மா.க.பணிப்பாளர் (நிதி) 081-2223343 / Additional Provincial Director of Education.(Finance)


මගේ අංකය / எனது இல / My No: මප/අධ්‍යා/සාපා/20/ගුරුමාරු

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date 2026-06- 16

**වැදගත්- online ක්‍රමය ඔස්සේ කලාපය තුළ සහ අන්තර් කලාප සඳහා පමණක් මෙය අදාළ කර ගත යුතුය.**

සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු හා විදුහල්පතිවරුන් වෙත

## ශ්‍රී ලංකා ගුරු සේවයේ ස්ථානමාරු ක්‍රියාත්මක කිරීම - 2027

01. ගුරු සේවයේ ස්ථාන මාරුවීම් සඳහා පසුගිය වර්ෂයේ මෙන්ම මෙම වර්ෂයේද කලාපය තුළ සහ අන්තර් කලාප ස්ථානමාරු සඳහා ලිඛිත අයදුම්පත් කැඳවීමක් සිදු නොකරන අතර වර්ෂයට අදාළ දැන්වීම අපගේ www.centralprovinceedu.lk වෙබ් අඩවිය තුළ පළවීමෙන් අනතුරුව වෙබ් අඩවිය හරහා (online) අයදුම්පත සම්පූර්ණ කල යුතුය. ඒ සඳහා උපදෙස් මෙම පත්‍රිකාව මගින් ඔබට ලබා දෙනු ඇත.

    අන්තර්ජාල පහසුකම් නොමැති විදුහල්වල ගුරුවරුන් සඳහා ප්‍රාදේශිය පරිගණක සම්පත් මධ්‍යස්ථාන (CRC) හෝ තාක්ෂණික විද්‍යාගාරවලදී අවශ්‍ය පහසුකම් ලබා ගැනීමට කටයුතු සුදානම්කර දිය යුතුය. ඒ සඳහා අදාළ මධ්‍යස්ථාන භාරකරුවන් හා විදුහල්පතිවරුන් දැනුවත් කිරීම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු වෙත පැවරේ.

    a. අන්තර්ජාලයේ www.centralprovinceedu.lk දරන අපගේ වෙබ් පිටුවට පිවිසෙන්න.
    b. 2027 ගුරුමාරු අයදුම්පත තිරයට ලබා ගැනීම.
    c. එහි ඇති 2027 ගුරුමාරු අයදුම්පත එවේලේම පිරවීම.
    d. අවසානයේ ඇති Submit බොත්තම ඔබා අයදුම්පත අපගේ දත්ත පද්ධතියට ඇතුලත් කිරීම.
    e. නිවැරදිව ඇතුලත් වූ අයදුම්පතක් සඳහා ගුරුවරයාගේ නමට ලියාපදිංචි අංකයක් එසැනින් තිරයේ දිස්වීම/නිවැරදි බවට එසැනින් තිරයේ දිස්වීමක් සිදුවනු ඇත.

02. මෙසේ ගුරුවරයා විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත් නියමිත කාල වකවානුව අවසන් වූ පසු (Closing dateවලින් පසු) කලාප ගුරුමාරු විෂයභාර අධ්‍යක්ෂවරයා විසින් අදාළ විදුහල්පතිවරු කැඳවා ඔවුන්ගේ නිර්දේශ ලබා ගත යුතුය. (ගුරු භවතුන් විසින් පත්වීමේ සඳහන් අනිවාර්ය සේවා කාලය සම්පූර්ණ කිරීමේ දී නිවැරදි සංඛ්‍යා සටහන් නොකරන බව අනාවරණය වන බැවින් මේ සම්බන්ධව සැලකිලිමත්ව කටයුතු කරන ලෙස දන්වමි)

03. ඉන් පසුව කලාප ගුරුමාරු මණ්ඩලය කැඳවා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කලාපයේ නිර්දේශ ලබා දිය යුතුය. ඒ සඳහා online අයදුම්කල එක් එක් ගුරුවරයා සඳහා ලේඛනයක ඔහු/ඇය සම්බන්ධයෙන් ගත් තීරණය ඇතුලත් කර ගුරුමාරු මණ්ඩල නියෝජිත අත්සන් ලබා ගත යුතුය. අවසාන තීරු දෙකේ අදාළ විදුහල්පතිගේද අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේද අත්සන් තැබිය යුතුය.

02 වන පිටුවට.......

04. නියමිත කාල වකවානුවේදී කලාපය තුල ස්ථාන මාරු කරන ලද ගුරුවරුන් වෙත විධිමත් ස්ථාන මාරු ලිපි නිකුත් කළ යුතු ය.

05. අන්තර් කලාප ස්ථාන මාරු අයදුම්පත් සඳහා අදාල තීරණ ලබා දීම පළාත් මාරු මණ්ඩලය හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදු කරනු ලබයි.ඉන් පසුව එක් එක් කලාපය සඳහා ස්ථාන මාරුවීම් ලබන ගුරු භවතුන්ගේ නාම ලේඛන පළාත් අධ්‍යක්ෂ විසින් ඒ ඒ කලාප වෙත යොමු කරනු ඇත.

06. තම කලාපයට වෙනත් කලාපවලින් ස්ථාන මාරු කරන ලද ගුරුවරුන් මෙන්ම කලාපය තුළ ස්ථාන මාරු කරනු ලබන ගුරුවරුන් වෙත 2026 දෙසැම්බර් 16 දින සිට ක්‍රියාත්මක වන පරිදි විධිමත් ස්ථාන මාරු ලිපි නිකුත් කිරීම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදු කළ යුතු ය.

07.එක් ගුරුභවතකුට අයදුම් කළ හැක්කේ අන්තර් පළාත්, ජාතික පාසල්, අන්තර් කලාප සහ කලාපය ඇතුලත ස්ථාන මාරු වර්ග 04 න් එක් ස්ථාන මාරු වර්ගයක් පමණක් බැවින් මේ සම්බන්ධව සැලකිල්ලට ගන්නා ලෙසද වැඩිදුරටත් දන්වමි.

ඩී.එම්.එම්.පී.දිසානායක,
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
මධ්‍යම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙනුවට.

ඩී.එම්.එම්.පී.දිසානායක
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (පාලන)
මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
මහනුවර.

පිටපත්:-

1. මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා :- කා.දැ.පිඃ
2. ලේකම්, මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය :- දැ.ගැ.පි.
3. සියලු කලාපවල CRC මධ්‍යස්ථාන
   :-අවශ්‍ය ගුරුවරුන්ට 2027 ගුරු ස්ථානමාරු අයදුම්පත් සම්පූර්ණ කිරීමට අන්තර්ජාල පහසුකම් ලබා දීම, සහ සහාය වීම සඳහා
4. මහින්දෝදය විද්‍යාගාර සහිත සියලු පාසල්වල විදුහල්පතිවරු :-
   :-අවශ්‍ය ගුරුවරුන්ට 2027 ගුරු ස්ථානමාරු අයදුම්පත් සම්පූර්ණ කිරීමට අන්තර්ජාල පහසුකම් ලබා දීම සහ සහාය වීම සඳහා